අධ්‍යාපන අමාත්‍යාංශය
ජාතික භාෂා හා මානව ශාස්ත්‍ර ශාඛාව
සිංහල භාෂා ඒකකය

## සිංහල භාෂාව හා සාහිත්‍ය තරගාවලිය - 2023
පළාත් මට්ටම

01. අපේක්ෂකයාගේ නම : ....................................................................................................
(මුලකුරු සමග නිවැරදි ව ලියන්න)

02. විදුහලේ නම සහ ලිපිනය : ....................................................................................................

03. පාසල් වර්ගය : 200 අඩු / 201-500 තෙක් /500ට වැඩි

04. කලාපය : ....................................................................................................

05. පළාත : ....................................................................................................

# ගද්‍ය රචනා හා ප්‍රායෝගික ලේඛන

**8 ශ්‍රේණිය** **කාලය පැය 02යි.**

I කොටසින් එකක් ද II කොටසේ (අ) යටතේ එකක් ද (ආ) යටතේ එකක් ද (ඉ) යටතේ එකක් ද වශයෙන් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.

## I කොටස

1. පහත දැක්වෙන මාතෘකාවලින් **එකක්** තෝරා ගෙන වචන 250 - 300 අතර රචනයක් ලියන්න.

(අ) අතීත මිනිසාගේ විවිධ සිතුම් පැතුම් මුල් කර ගෙන බිහි වූ වටිනා ජන සාහිත්‍යයක් අපට උරුම වී ඇත. එම ජන සාහිත්‍යයේ ප්‍රධාන අංගයක් ලෙස 'ජනකතාව' දැක්විය හැකි ය. රසය ඉස්මතු කරමින් කිසියම් ජීවිත ආදර්ශ ගෙන හැර දැක්වීම අරමුණු කර ගත් ජන කතා රාශියකි. **ජන කතාවලින් ජීවිතයට ලැබෙන ආදර්ශ** යන මාතෘකාව යටතේ රචනයක් ලියන්න.

(ආ) ඈත අතීතයේ සිට ම විවිධ අරමුණු පදනම් කර ගෙන උත්සව පැවැත්වේ. එක් එක් ජන සමාජවලට අනන්‍ය එබඳු උත්සව අතර සිංහල අවුරුදු උත්සවය සිංහල ජන සමාජයේ සැමරෙන වැදගත් උත්සවයකි. එයට අනන්‍ය වූ චාරිත්‍ර වාරිත්‍ර සමූහයක් ඇත. **සිංහල අලුත් අවුරුදු උත්සවයෙන් පිළිබිඹු වන දේශීය සිරිත් විරිත්** යන මාතෘකාව යටතේ රචනයක් ලියන්න.

(ඇ) ළමයින්ගේ රසවින්දනය උදෙසා නිර්මාණය වන සාහිත්‍යය, ළමා සාහිත්‍යය ලෙස සැලකිය හැකි ය. ළමා සාහිත්‍ය නිර්මාණ ළමා මනස පුබුදුවමින් ජීවිතාදර්ශ ද සපයයි. එබඳු ගුණාත්මක ළමා සාහිත්‍ය කෘති නිර්මාණය කිරීම කාලීන අවශ්‍යතාවකි. **සුන්දර ළමා සාහිත්‍යයක් ළමුන්ට උරුම කරමු** යන මාතෘකාව යටතේ රචනයක් ලියන්න.

(ඈ) අතීතයේ මිනිස්සු පොත පත කියවීම කෙරෙහි වැඩි වශයෙන් නැඹුරු වී සිටියහ. වර්තමානයේ මිනිසාට දැනුම ලබා ගත හැකි මාර්ග බොහෝ ය. ඒවා තාක්ෂණික හා විද්‍යාත්මක දියුණුව හමුවේ දිනෙන් දින දියුණු වෙයි. එසේ වුවත් පොත් කියවීමේ අගය අදටත් අඩු වී නැත. **පොත් කියවමු ලොව ම දිනමු** යන මාතෘකාව යටතේ රචනයක් ලියන්න.

(ඉ) වර්තමානයේ දී කැලිකසළ කළමනාකරණය බැරෑරුම් ප්‍රශ්නයක් වී ඇත. විශේෂයෙන් කර්මාන්තශාලාවලින් බැහැර කරන විද්‍යුත් අපද්‍රව්‍ය, පොලිතින් ආදි ද්‍රව්‍ය ජීව, අජීව පරිසරවලට බලවත් අභියෝගයක් වී ඇත. මෙම අභියෝගය ජය ගත හැක්කේ හිතකර වූ පරිසර ආකල්ප වැඩි දියුණු කිරීමෙනි. **කැලිකසළ කළමනාකරණය කර රට ගොඩ නගමු** යන මාතෘකාව යටතේ රචනයක් ලියන්න.

(ලකුණු 40 යි.)

Downloaded from Past Papers Wiki - Extensive collection of Past papers, Notes and much more! CamScanner

## II කොටස

(අ) (i) ඔබ පාසලේ කෘෂිකර්ම සංගමය මගින් සැලසුම් කළ " හොඳ ම ගෙවත්ත " තේරීමේ තරගාවලිය පිළිබඳ පාසල් සිසුන් හා දෙමවුපියන් දැනුවත් කිරීමේ දේශනයක් පැවැත්වීමට කටයුතු යොදා ඇත. එම දේශනය සඳහා කෘෂිකර්ම උපදේශකවරයෙකුගේ සහාය ලබා දෙන ලෙස ඉල්ලමින් දිස්ත්‍රික් කෘෂිකර්ම දැනුවත් කිරීම් වැඩසටහනක අධ්‍යක්ෂ වෙත යවන **ලිපිය** ලියන්න.

(ii) කොට්ඨාස මට්ටමින් සංවිධානය කෙරෙන විද්‍යා හා තාක්ෂණ ප්‍රදර්ශනයට සමගාමී ව දේශන මාලාවක් පැවැත්වීමට ඔබ පාසලේ විද්‍යා සංගමය මගින් සැලසුම් කර ඇත. ඒ සඳහා සහාය ලබා දෙන මෙන් ඉල්ලා විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශයේ ලේකම් වෙත යවන **ලිපිය** ලියන්න.

(ලකුණු 20 යි.)

(ආ) (i) ස්වයං රැකියාවල නියුතු බොහෝ පිරිසක් සිටින ඔබ ප්‍රදේශයේ අලුතින් පිහිට වූ නව බැංකු ශාඛාවකින් ඔවුන්ට ආධාර ලබා දීමට කටයුතු කරයි. එසේ නමුත් එම රැකියාලාභීන් ඒ පිළිබඳව ප්‍රමාණවත් පරිදි දැනුවත් වී නොමැති බව පෙනේ. නව බැංකු ශාඛාව මගින් ස්වයං රැකියා ලාභීන් වෙනුවෙන් ලබා දෙන සේවා සහ ප්‍රතිලාභ පිළිබඳ දැනුවත් කිරීමට සුදුසු **දැන්වීම් පත්‍රිකාවක්** සකස් කරන්න.

(ii) ඔබේ ගම් ප්‍රදේශයේ පැවැත්වූ සිංහල අලුත් අවුරුදු උත්සවයේ දී දේශීයත්වයට මුල් තැන දෙමින් පැවැත්වූ සංස්කෘතිකාංග රාශියකි. අභාවයට යමින් පවතින බොහෝ ක්‍රීඩා හා චාරිත්‍ර විධි ද එහි දී ඉදිරිපත් කෙරිණි. ඒ පිළිබඳ තොරතුරු ඇතුළත් කරමින් පුවත්පතකට **වාර්තාවක්** ලියන්න.

(ලකුණු 20 යි.)

(ඉ) (i) ඔබ පාසලේ සිංහල සාහිත්‍ය දින උත්සවයට සමගාමී ව පොත් ප්‍රදර්ශනයක් පැවැත්වීමට තීරණය වී ඇත. ඒ පිළිබඳ සිසුන් දැනුවත් කිරීමට සුදුසු **පෝස්ටරයක්** නිර්මාණය කරන්න.

(ii) ඔබ පාසලේ පරිසර සංගමය වාර්ෂිකව පවත්වන පරිසර කඳවුර මෙවරත් පැවැත්වීමට සැලසුම් කර ඇත. එයට සහභාගි වන ලෙස දන්වමින් අවට පාසල් වෙත යවන **ආරාධනා පත්‍රය** සකස් කරන්න.

(ලකුණු 20 යි.)

PAST PAPERS WIKI

(2) WWW.PastPapers.WiKi (2)

CamScanner